SRI LANKA

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# AA1 විභාගය - 2018 ජූලි

# ප්‍රශ්න සහ යෝජිත උත්තර
# (AA13)

## ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව
## (EBA)


ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
නො. 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන : 011-2-559 669



මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශය

## AA1 විභාගය - 2018 ජූලි

## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

## යෝජිත උත්තර

**A කොටස**

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**

**අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.**

**(මුළු ලකුණු 40)**

### 1 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| ප්‍රශ්න අංකය | | උත්තරය |
|---|---|---|
| 1.1 | - | (1) |
| 1.2 | - | (3) |
| 1.3 | - | (3) |
| 1.4 | - | (1) |
| 1.5 | - | (1) |
| 1.6 | - | (4) |
| 1.7 | - | (3) |
| 1.8 | - | (1) |
| 1.9 | - | (4) |
| 1.10 | - | (1) |
| 1.11 | - | සත්‍යයි. |
| 1.12 | - | අසත්‍යයි. |
| 1.13 | - | සත්‍යයි. |
| 1.14 | - | අසත්‍යයි. |
| 1.15 | - | සත්‍යයි. |
| 1.16 | - | ව්‍යවසායකත්වය |
| 1.17 | - | නැත. |
| 1.18 | - | සාමාන්‍ය |
| 1.19 | - | සමතුලිත පොළී අනුපාතිකය |
| 1.20 | - | ආර්ථික සංවර්ධනය |

***(කොටසකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)***

***A* කොටසෙහි අවසානය.**

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න හතරකි. (04)
(මුළු ලකුණු 40)

## 2 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a) **Underlying assumptions of PPC**

(i) **සම්පත් පූර්ණ වශයෙන් භාවිත කරයි.**
(ආර්ථිකය සහ එහි සම්පත් පූර්ණ වශයෙන් භාවිත කර, කළ හැකි උපරිම නිෂ්පාදනය සිදු කරයි)

(ii) **යොදාගත හැකි උපරිම තාක්ෂණය යොදාගන්නා අතර එය ස්ථාවර බව උපකල්පනය කරයි.**
(තාක්ෂණය යනු, භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා යොදාගන්නා දැනුමයි. තාක්ෂණය ස්ථාවර වීම නිසා ආර්ථිකයට නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ හා සේවාවලට සීමාවක් පැනවේ.)

(iii) **භාණ්ඩ වර්ග දෙකක් පමණක් නිෂ්පාදනය කරයි.**
(ආර්ථිකය භාණ්ඩ වර්ග දෙකක් පමණක් නිෂ්පාදනය කරන බව උපකල්පනය කරයි.)
(උදා:- පාරිභෝගික භාණ්ඩ හා ප්‍රාග්ධන භාණ්ඩ)

(iv) **සාධක හිමිකාරිත්වය නොවෙනස්ව පවතී.**

(v) **නිෂ්පාදන හැකියා මායිම්, දෙන ලද කාලසීමාවක් සඳහා නිර්මාණය කරයි.**

***(ලකුණු 03)***

(b) ධනවාදී (වෙළෙඳපොළ) ආර්ථිකය හා සමාජවාදී (සැලසුම්ගත) ආර්ථිකයක වෙනස්කම්

| ධනවාදී (වෙළෙඳපොළ) ආර්ථිකය | සමාජවාදී (සැලසුම්ගත) ආර්ථිකය |
|---|---|
| ආර්ථිකය හසුරුවන්නේ පෞද්ගලික අංශය විසිනි. | ආර්ථිකය පාලනය කරනුයේ රාජ්‍ය අංශය විසිනි. |
| පාරිභෝගික ස්වාධිපත්‍යයක් ඇත. | පාරිභෝගික ස්වාධිපත්‍යයක් නැත. |
| සමාජයේ ජීවත් වන පුද්ගලයන් අතර අසමානතාවක් දක්නට ලැබේ. | සමාජයේ ජීවත් වන සාමාජිකයන් අතර අසමානතාවක් දක්නට නැත. |
| පුද්ගලික අංශය විසින් පරිසරයට වන හානිය නොසලකා හරී. | පරිසරය රැකගැනීම අපේක්ෂාවයි. |
| වෙළෙඳපොළේ භාණ්ඩවලට ඇති ඉල්ලුම හා සැපයුම මත භාණ්ඩවල මිල තීරණය වේ. | මධ්‍යම පාලන අධිකාරියක් මගින් ආර්ථික කටයුතු පාලනය කරයි. |
| සම්පත් හිමිකාරිත්වය පුද්ගලික අංශය සතුවේ. | සම්පත් හිමිකාරිත්වය රාජ්‍ය අංශය සතුවේ. |
| වෙළෙඳපොළ මිල මත සියලු ආර්ථික තීරණ පදනම් වේ. | තීරණ ගැනීමේ දී සමාජ සුබසාධනය සලකා බලයි. |

***(ලකුණු 03)***

(b) සමතුලිත මිල

(i) රු. **10**; සමතුලිතයේ දී,

$$Qd = Qs$$
$$80 - 6p = -20+4p$$
$$100 = 10P$$
$$\mathbf{P = 10}$$

***(ලකුණු 02)***

(ii) රු:**20** (Qd = 80 - 6 * 10)
හෝ
(Qs = -20 + 4p)

***(ලකුණු 02)***

***(මුළු ලකුණු 10)***

## 3 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර


(A) **මුළු නිෂ්පාදනය, සාමාන්‍ය නිෂ්පාදනය හා ආන්තික නිෂ්පාදනය අතර ඇති සම්බන්ධතාවය**

දෙන ලද සම්පත් ප්‍රමාණයක් භාවිත කර නිෂ්පාදනය කළ හැකි මුළු ඒකක ගණන, මුළු නිෂ්පාදනය (TP) ලෙස සැලකේ. සාමාන්‍ය නිෂ්පාදනය (AP) යනු යෙදවුම් ඒකකයක් සඳහා නිමවුම වන අතර එය ගණනය කරනුයේ මුළු නිෂ්පාදනය යෙදවුම් ඒකක ගණනින් බෙදීමෙනි. ආන්තික නිෂ්පාදනය (MP) යනු මුළු යෙදවුම්වල වෙනස්වීම නිසා මුළු නිෂ්පාදනයේ (TP) සිදුවන වෙනස්වීමයි. ($\Delta TP / \Delta L$)

භාණ්ඩයක නිෂ්පාදන ශ්‍රිතය පහත ප්‍රස්ථාරයෙන් නිරූපනය කෙරේ. විවිධ විකල්ප ප්‍රමාණවල සේවක ශ්‍රමය නිශ්චිත භූමි ප්‍රමාණයකට අනුව නිශ්චිත කාලසීමාවකට අනුව නිර්මාණය කර ඇත. මුළු නිෂ්පාදනය (TP), සාමාන්‍ය නිෂ්පාදනය (AP) සහ ආන්තික නිෂ්පාදනය (MP) යන වක්‍ර ඉහත භාණ්ඩයට අදාළව පහතින් දක්වා ඇත.

නිෂ්පාදන සංකල්පයන් අතර වැදගත් සබඳතාවන් දෙකක් හඳුනාගත හැකිය.

- මුළු නිෂ්පාදනය උපරිම වන අවස්ථාවේ දී ආන්තික නිෂ්පාදනය ශුන්‍ය වන අතර මුළු නිෂ්පාදනය අඩු වන විට ආන්තික නිෂ්පාදනය සෘණ අගයක් ගනී.
- සාමාන්‍ය නිෂ්පාදනය උපරිම අගයේ දී ආන්තික නිෂ්පාදන වක්‍රය, සාමාන්‍ය නිෂ්පාදන වක්‍රය ඡේදනය කරයි. එමනිසා ව්‍යාපාරයක සාමාන්‍ය නිෂ්පාදනය උපරිම වන විට එහි සාමාන්‍ය නිෂ්පාදනය හා ආන්තික නිෂ්පාදනය එකිනෙකට සමාන වේ.




***(ලකුණු 06)***

(B) ඒකාධිකාරය (**Monopoly**) හා ඒකාධිකාරී තරගය (**Mpnopolistic Competition**) අතර වෙනස්කම්

**1. භාණ්ඩ වර්ගය**

ඒකාධිකාරයේ දී එක් භාණ්ඩයක් පමණක් නිෂ්පාදනය කරන අතර ඒකාධිකාරී තගරයේ දී වෙනස් භාණ්ඩ නිෂ්පාදනය කරයි.

**2. විකුණුම්කරුවන් ගණන**

ඒකාධිකාරයේ දී එක් විකුණුම්කරුවෙක් පමණක් සිටින අතර ඒකාධිකාරී තරගයේ දී තරගකරුවන් විශාල සංඛ්‍යාවක් සිටී.

**3. පිවිසීමේ හා පිටවීමේ ඇති හැකියාව**

ඒකාධිකාරී වෙළෙඳපොළක ඇතුළුවීම සඳහා බාධක ඇති අතර ඒකාධිකාරී තරගයට අබාධ පිවිසුමක් පවතී.

**4. තරගකාරිත්වය**

ඒකාධිකාරයේ තරගකාරිත්වයක් නොපවතින අතර ඒකාධිකාරී තරගයේ ආයතන අතර තදබල තරගයක් පවතී.

**5. ඉල්ලුම් වක්‍රයේ හැඩය**

ඒකාධිකාරී තරගයේ ඍණ බෑවුමක් සහිත ඉල්ලුම් වක්‍රයක් හා ඉහළ නම්‍යතාවක් පවතින අතර ඒකාධිකාරයේ දී මෙය අනම්‍ය වේ.

**6. දිගුකාලයේ දී ලාභදායිත්වය**

ඒකාධිකාරී තරගයේ දී සාමාන්‍ය ලාභ පමණක් උපයන අතර ඒකාධිකාරයේ දී ආයතනයක් ආර්ථික ලාභ උපයයි.

**7. ප්‍රචාරණය**

ඒකාධිකාරී තගරයේ දී යම් මට්ටමකට ප්‍රචාරණය දැකිය හැකි අතර ඒකාධිකාරයේ දී භාණ්ඩ ප්‍රචාරණයක් සිදු නොවේ.

*(ලකුණු 04)*
*(මුළු ලකුණු 10)*

## 4 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a) **භාණ්ඩයක් සඳහා ඒකක සහනාධාරයක් ලබාදීමේ ප්‍රතිවිපාකඃ**


නිෂ්පාදකයන්ට හෝ පාරිභෝගිකයන්ට සහන ලබාදීමේ පරමාර්ථයෙන් රජයක් විසින් සහනාධාර ප්‍රදානය කරනු ලබයි. ඒ අයුරින් ගත් කල නිෂ්පාදන සහනාධාර හා පාරිභෝගික සහනාධාර ලෙස සහනාධාර වර්ග දෙකක් හඳුනාගත හැකිය.

නිෂ්පාදන සහනාධාරයක් යනු නිෂ්පාදකයන්ගේ පිරිවැය අඩු කොට ඔවුන් දිරිමත් කර නිෂ්පාදනය වැඩි කිරීමේ අරමුණින් නිෂ්පාදකයන්ට කරනු ලබන ගෙවීමකි.

පාරිභෝගිකයන්ට සහනයක් සැලසීමේ අරමුණින්, අදාළ භාණ්ඩය සහනදායී මිලකට පාරිභෝගිකයන්ට සපයන ලෙස දන්වමින් රජය විසින් නිෂ්පාදකයන්ට ගෙවීමක් සිදු කරයි නම් එය පාරිභෝගික සහනාධාරයක් ලෙස සැලකේ.

රජය සහනාධාර ලබාදීමේ ප්‍රතිඵලයක් ලෙස සැපයුම ඉහළ ගොස් වෙළෙඳපොළ සමතුලිත මිල පහළ යයි. සහනාධාරය නිසා ව්‍යාපාරයේ සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ. සහනාධාරය වෙනුවෙන් වෙන් කළ මුදල ඒකකයක් සඳහා සහනාධාරය, මුළු නිමැවුමෙන් ගුණ කළ විට ලැබෙන පිළිතුරට සමාන වේ.

සහනාධාරයට පසු මිලෙහි සිදුවන අඩුවීම පාරිභෝගිකයාට හිමිවන වාසිය වන අතර භාණ්ඩයේ මිලට නොගැළපෙන සහනාධාරයේ ඉතිරි කොටස නිෂ්පාදකයාට අත්වන වාසියයි.




***(ලකුණු 06)***

(b) (i) **වෙළෙඳපොළ ආර්ථිකයකට රජය මැදිහත් වීමට හේතු:**

1. වෙළෙඳපොළේ අසමත්වීම් නිවැරදි කිරීමට
2. ආදායම හා ධනය වඩාත් සාධාරණ ලෙස නිෂ්පාදන සාධක අතර බෙදාදීමට
3. ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය වර්ධනය කිරීමට
4. රජයේ මැදිහත් වීම හරහා යටිතල පහසුකම් ලබාදීමට
5. බාහිරින් ඇති කරන ක්‍රියාකාරකම්වලට රජය මැදිහත් වේ.

***(ලකුණු 02)***

(ii) **සහනාධාර ලබාදීමට අමතරව වෙළෙඳපොළ ආර්ථිකයට රජය මැදිහත් වන ආකාර:**

- මිල පාලනයන්
  - o උපරිම මිල සීමාව
  - o අවම මිල සීමාව
- වක්‍ර බදු
- රාජ්‍ය ව්‍යවසාය
- පොදු භාණ්ඩ සැපයීම

***(ලකුණු 02)***

***(මුළු ලකුණු 10)***

## 5 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය:**

පහත වගුවට අනුව, A රටට භාණ්ඩ දෙක ම නිෂ්පාදනය කිරීමේ නිරපේක්ෂ වාසිය පවතී.

B ට නිරපේක්ෂ වාසියක් නොපැවතීම නිසා B ට විශේෂීකරණය හරහා කිසිඳු වාසියක් අන්තර්ජාතික වෙළෙඳාමෙන් ලබාගත නොහැකි බව කෙනෙකුට තර්ක කළ හැකිය. නමුත්, එය නිවැරදි නොවේ. සාපේක්ෂ වාසිය නොමැති රටකට නිරපේක්ෂ වාසිය හරහා විශේෂීකරණයේ වාසි ලබාගත හැකිය. රටකට කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ වාසිය ඇත්දැයි විමසීම සඳහා එම භාණ්ඩ දෙකෙහි ආවස්ථික පිරිවැය ගණනය කිරීම අවශ්‍ය වන අතර එය පහත ආකාරයෙන් ගණනය කරයි.

එක් භාණ්ඩයකින් භාණ්ඩ ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා අනෙක් භාණ්ඩයෙන් කැප කළ යුතු ඒකක ප්‍රමාණය ආවස්ථික පිරිවැයයි.

| රට | තිරිඟු (Kg) | අර්තාපල් (kg) |
|---|---|---|
| A | 6 | 4 |
| B | 1 | 3 |

| රට | තිරිඟු පිටි 1kgක් සෑදීමේ ආවස්ථික පිරිවැය | අර්තාපල් 1kgක් සෑදීමේ ආවස්ථික පිරිවැය |
|---|---|---|
| A | 0.67 | 1.50 |
| B | 3.00 | 0.33 |

ඉහත වගුවට අනුව, තිරිඟු පිටි සෑදීමේ ආවස්ථික පිරිවැය B රටට වඩා A රටේ අඩු මට්ටමක පවතින අතර, ඒ අනුව තිරිඟු පිටි සෑදීමේ සාපේක්ෂ වාසිය A රටට හිමි වේ.

A රටට වඩා B රටෙහි අර්තාපල් සැකසීමේ ආවස්ථික පිරිවැය අඩු මට්ටමක පවතින නිසා අර්තාපල් සැකසීමේ සාපේක්ෂ වාසිය B රටට පවතී.

*(ලකුණු 06)*

(b) රුපියලේ අගය ඩොලරයේ අගයට එරෙහිව ක්ෂය වීමේ ප්‍රතිඵල

- විදේශීය සංචාරකයන් රට තුළට පැමිණීම දිරිමත් කරයි.
- අපනයනකරුවන්ට වාසිදායක වේ.
- මිලෙහි වැඩිවීම නිසා ආනයනවල මිල ඉහළ නගී.
- මූර්ත ආදායම පහළ බසී.
- ශ්‍රී ලංකාවේ ආනයනවලට වඩා අපනයන වැඩිවීම නිසා ජංගම ගිණුමේ හිඟය වැඩි වේ.
- විදේශ මුදලින් ඇති ණය ඉහළ යයි.
- භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යාම නිසා උද්ධමනයක් හටගනී.
- රටක ජනතාවගේ අත්‍යවශ්‍ය මියදම් කපා හැරීමට බල කරමින් මුදලේ ක්‍රය ශක්තිය පහළ බසින අතර, මෙය රටේ ජනතාවගේ ජීවන මට්ටම පවත්වා ගැනීම සඳහා තර්ජනයක් එල්ල කරයි.

*(ලකුණු 04)*

*(මුළු ලකුණු 10)*

***B* කොටසෙහි අවසානය.**

## C කොටස

අනිවාර්ය ප්‍රශ්නයකි.
(මුළු ලකුණු 20)

## 6 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(A) (i) **ශ්‍රී ලංකා මහ බැංකු මූල්‍ය ප්‍රතිපත්තියේ ගුණාත්මක (වරණාත්මක) පාලනයන්**

- ශිෂ්ඨ ප්‍රයෝග ක්‍රියාත්මක කිරීම
- වාණිජ බැංකු ණය සඳහා උපරිම කල්පිරීමේ කාල නියම කිරීම
- ශීර්ෂ පිළිබඳ උපරිම සීමා පැනවීම
- වරණ පොලී අනුපාත නියම කිරීම
- ප්‍රතිමූල්‍ය පහසුකම් ඇති කිරීම

*(ලකුණු 03)*

(ii) **Banks face the challenge of maintaining a balance between the two conflicting objectives of liquidity and profitability.**

ආර්ථිකයක් තුළ වාණිජ බැංකු විසින් සම්බන්ධ වන මූල්‍ය අතරමැදි ක්‍රියාවලියට මූල්‍ය අතිරික්ත ඒකක වෙතින් තැන්පත් භාරගැනීම හා මූල්‍ය හිඟයක් පවතින ඒකක වෙත ණය පහසුකම් සැපයීම ඇතුළත් වේ.

එමනිසා වාණිජ බැංකු තම ව්‍යාපාර කටයුතු සිදුකරනු ලබන්නේ වෙනත් පාර්ශ්ව වෙතින් ලබාග න්නා අරමුදල් යොදාගනිමිනි. වෙනත් පාර්ශ්ව වෙතින් තැන්පත් ලෙස අරමුදල් රැස් කිරීම සඳහා අදාළ බැංකුව කෙරෙහි ජනතාවගේ විශ්වසනීයත්වය පවත්වාගෙන යාම අතිශයින්ම වැදගත් වේ. එම විශ්වසනීයත්වය පවත්වාගෙන යාම සඳහා වාණිජ බැංකුවලට ඉතාමත් සතුටුදායක ද්‍රවශීලතා මට්ටමක් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. අනෙක් අතට, බැංකුවක් තම ලාභදායිත්වය වැඩි කරගැනීම සඳහා ආදායම් උපයාගත හැකි පරිදි හැකි තරම් ණය පහසුකම් ලබාදිය යුතුය.

උපරිම ආරක්ෂාවක් ලබාගැනීම සඳහා බැංකු විසින් ඔවුන් ලබාගන්නා තැන්පතු ප්‍රමාණයට එරෙහිව ඉහළ තැන්පතු ප්‍රමාණයක් තබාගත යුතුය. නමුත් මෙමගින් බැංකුවලට කිසිඳු ලාභයක් අත් නො-වේ. එමනිසා බැංකු විසින් උපරිම ආරක්ෂාවක් කරා යාම සඳහා, ලාභදායිත්වය යන අරමුණ අත්හැරිය යුතුය. අනෙක් අතට, ලාභදායිත්වය වර්ධනය කිරීම සඳහා ආයෝජන සිදු කරයි නම් ඔවුන්ට පාරිභෝගිකයා මුදල් ඉල්ලු සැනින් ගෙවීමට සිදුවීම යන ප්‍රශ්නයට මුහුණදීමට සිදුවේ. එමනිසා බැංකුවකට ලාභදායිත්වය හා ද්‍රවශීලතාව යන ද්විත්ව අරමුණු අතර සන්සන්දනයක් කර ලාභදායිත්වය හා ද්‍රවශීලතාව සම මට්ටමක පවත්වා ගැනීම ඉතා දුෂ්කර වේ.

එමනිසා බැංකු මෙම ගැටෙන අරමුණු අතර සමබරතාවක් පවත්වාගැනීමේ අරමුණට සාර්ථකව මුහුණදිය යුතුය.

*(ලකුණු 04)*

(B)

(a) දළ දේශීය වියදම

**E1 = C + I+ G**

= 1500+3000 +1500

= **6000**

*(ලකුණු 04)*

(b) වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය

= **දළ දේශීය වියදම+ ශුද්ධ අපනයන**

= 6000+2500

= **8500**

***(ලකුණු 02)***

(c) වෙළෙඳපොළ මිලට දළ ජාතික නිෂ්පාදිතය

| | | |
|---|---|---|
| වෙළෙඳපොළ මිලට දළ ජාතික නිෂ්පාදිතය | = | 8500 |
| විදේශීය ශුද්ධ සාධක ආදායම | = | 750 |
| වෙළෙඳපොළ මිලට දළ ජාතික නිෂ්පාදිතය | = | **9250** |

***(ලකුණු 02)***

(d) වෙළෙඳපොළ මිලට ශුද්ධ ජාතික නිෂ්පාදිතය = දළ ජාතික නිෂ්පාදිතය - ප්‍රාග්ධන ක්ෂය

= 9250-1000

= **8250**

***(ලකුණු 02)***

(C) **රජයේ සාර්ව ආර්ථික අරමුණු**

- **මිල ස්ථායිතාව (පහළ හා ස්ථාවර උද්ධමනය)**
  (උද්ධමනයකින් හෝ අවධමනයකින් තොරව ආර්ථිකය ස්ථාවරව පවත්වාගෙන යාමයි. ආර්ථිකය ඉතා පහළ උද්ධමන අනුපාතයන්ගෙන් සමන්විත වන විට ආර්ථිකයේ සාමාන්‍ය මිල මට්ටම ස්ථාවර ලෙස සැලකිය හැකිය.)

- **පූර්ණ සේවා නියුක්තිය**
  ආර්ථිකය සතු සියලුම සම්පත් පූර්ණ හා උපරිම කාර්යක්ෂමතාවකින් නිෂ්පාදන කටයුතු සඳහා උපයෝජනය කිරීම, පූර්ණ සේවා නියුක්තිය ලෙස සැලකේ. පූර්ණ සේවා නියුක්තිය ලබාගැනීම සඳහා සේවක විරැකියාව අවම කළ යුතු අතර ඒ සඳහා රැකියා අවස්ථා වැඩි කළ යුතුය.

- **ගෙවීම් ශේෂ සමතුලිතතාව**
  විදේශ රටවල් සමග සිදු කරන ගනුදෙනුවල දී ගෙවුම් ශේෂ අර්බුදවලින් තොරව ආර්ථිකය පවත්වාගෙන යාම මින් අදහස් වේ.

- **ආදායම සාධාරණ ලෙස බෙදාහැරීම**
  සාධාරණ ආදායම් ව්‍යාප්තියක් ඇති කරලීම මින් අදහස් වේ. එනම්, ආර්ථිකයක සියලුම පුද්ගලයන්ගේ අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි ආදායම, ධනය බෙදාහැරීමයි.

- **තිරසාර සංවර්ධනය**

***(මුළු ලකුණු 20)***

***C* කොටසෙහි අවසානය.**

***Notice :***

These answers complied and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.
These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers".
The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2018 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*
*All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*